**ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව - 2023**

**------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාවේ (“ සභාව”) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාම් රු.21,995,626 ක් අඩුවෙන්ද, ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලාඒම් රු.48,220,000 ක් අඩුවෙන්ද ගලපා තිබුණි. තවද, සභාවේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී ප්‍රධාන මුදල් පොතේ ශේෂයන් පමණක් සැලකිල්ලට ගෙන තිබූ අතර පර්යේෂණ ව්‍යාපෘති සඳහා ජංගම ගිණුම්වලට මාරු කරනු ලැබූ මුදල්වලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතු වටිනාකම රු.68,108,055 ක් වූ ශේෂ සැලකිල්ලට ගෙන නොතිබුණි. | විගණනය විසින් පෙන්වාදුන් ආකාරයට 2024 වර්ෂයේ සිට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසීම සිදුකර බව. | ආයතනයේ සියළු මුදල් ලැබීම් හා සියලු මුදල් ගෙවීම්, අන්තර්ගත කර මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව සකස් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට එකතු වටිනාකම රු.246,532,425 ක් වූ අමාත්‍යාංශ ප්‍රදාන මගින් ආරම්භ කළ පර්යේෂණ ව්‍යාපෘති 60ක් නිම නොවී ඉටුකරමින් පැවති අතර, එම පර්යේෂණ වලින් ලැබෙන අනාගත ප්‍රතිලාභ සංවර්ධන වටිනාකම ලෙස හඳුනා ගෙන කෙරීගෙන යන වැඩ (Working Progress) ලෙස මූල්‍ය ප්‍රකාශන මගින් ඉදිරිපත් නොකර සම්පූර්ණ වියදමම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හරහා කපාහැරීම හේතුවෙන් එකී දිගුකාලීන වූ පර්යේෂණ ව්‍යාපෘති සඳහා මෙතෙක් සිදුකර තිබූ වියදමට සාපේක්ෂව ඒවායේ වර්තමාන තත්ත්වය මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් වී නොතිබුණි. | පර්යේෂණ වලින් ලැබෙන අනාගත ආර්ථික ප්‍රතිලාභ විශ්වාසදායක ලෙස හඳුනාගැනීමට නොහැකි බැවින් ඒ සඳහා වන වියදම දරන අවස්ථාවේ වියදමක් සේ සැලකීම සුදුසු බැවින් ඒවා මූල්‍ය කාර්යසාධනය ප්‍රකාශයට හර කර ඇත. එසේම පෙර ගිණුම් වර්ෂවලදී ද මෙම ක්‍රමවේදයම අනුගමනය කර ඇති බව. | ඉටු කරමින් පවතින ව්‍යාපෘති වල මූල්‍ය කාර්යසාධනය මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කළ යුතුය. |

## 1.6 නීති,රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 137 | මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා ගෙවීම් කිරීමේදී භාණ්ඩ ලැබීම් තුණ්ඩු (GRN) මඟින් තහවුරු කර ගැනීමෙන් පසු ගෙවීම් අනුමත කළ යුතු වුවත්, ව්‍යාපෘති වෙනුවෙන් කළ රු. 50,166,237 ක මිල දී ගැනීම් සඳහා කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මත පර්යේෂක විසින් යොදන සටහනක් මත පමණක් ගෙවීම් අනුමත කර ගෙන තිබුණි. | ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව විසින් ප්‍රදානය කරනු ලබන ව්‍යාපෘති සඳහා වන ප්‍රසම්පාදන කටයුතු පර්යේෂණ ප්‍රදානයන්ට උචිත පරිදි ජාතික පර්යේෂණ සභාව විසින් සකස්කර ඇති, පර්යේෂණ මාර්ගෝපදේශයට අනුකූලව පර්යේෂණ සභාවේ අනුමැතියද මත සිදු කර ඇත. එසේම පර්යේෂණ ආයතන මගින් ගනු ලැබූ ප්‍රසම්පාදන තීරණ ජාතික පර්යේෂණ සභාවේ ප්‍රසම්පාදන කමිටුව මගින්ද පරීක්ෂා කළ පසු අනුමැතිය ලබා දෙනු ලබන බව. | මුදල් රෙගුලාසි විධිවිධාන අනුකූලව මිල දී ගත් භාණ්ඩ සඳහා අදාළ තහවුරු කිරීම් කර ගැනීමෙන් පසු ගෙවීම් අනුමත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,998,779ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.172,111ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,170,889ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට, පුනරාවර්ථන ලැබීම් රු. 56,681,722 කින් අඩු වී තිබුණ ද වෙනත් ලැබීම් රු. 11,488,253 කින් වැඩි වීම සහ පර්යේෂණ හා සංවර්ධන වියදම් රු.51,998,881 කින් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වි තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික පර්යේෂණ සභාව විසින් 2020 හා 2022 වර්ෂ වලදී නිම කිරීමට නියමිතව පැවති පිරිවැය රු.14,588,238ක් වූ පර්යේෂණ ව්‍යාපෘති 05ක් සමාලෝචිත වර්ෂයේ නිමකර තිබුණි. ව්‍යාපෘති නිමවී මාස 3 ක් ඇතුලත සභාව වෙත අවසාන වාර්තා | පර්යේෂණ වල අවසාන වාර්තා ප්‍රමාදය හා නොලැබීම පිලිබඳවත් ඒ හේතුවෙන්, එකී ආයතනයට ඉදිරියේදී ලැබිය හැකි ජාතික පර්යේෂණ සභාවේ ව්‍යාපෘති ප්‍රදාන සඳහා අහිතකර බලපෑම් ඇතිවිය හැකි බවට, ප්‍රධාන පර්යේෂකයාගේ ආයතන ප්‍රධානියා දැනුවත් කිරීමද, අවසාන වාර්තා ලබා නොදෙන ප්‍රධාන පර්යේෂකයන් නැවත ජාතික පර්යේෂණ සභාවේ ව්‍යාපෘති ප්‍රදාන ලබාගැනීමට නොහැකි වන සේ අසාදුගත | අවසන් කර ඇති පර්යේෂණ ව්‍යාපෘති වල අවසාන වාර්තා පර්යේෂණ මාර්ගෝපදේශයේ සඳහන් පරිදි නියමිත දිනට ලබා ගැනීමට හැකිවන පරිදි ක්‍රමවේදයක් සැකසිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | භාරදිය යුතු බව ව්‍යාපෘති මාර්ගෝපදේශවල දක්වා ඇතත්, අවසන් කර ඇති පර්යේෂණ ව්‍යාපෘතිවල වාර්තාව විගණිත දින වූ 2024 ජුනි 25 වන විටත් භාර දී නොතිබුණි. | කිරීමද සිදුකරනු ලබන බව. | |
| (ආ) | පර්යේෂණ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පෙර ඒ සඳහා පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ හැකියාව හඳුනා ගතයුතු වුවත් එසේ නොකිරීමෙන් මහා භාණ්ඩාගාර ප්‍රදාන රු.11,241,250 ක් ලබාගෙන ආරම්භ කර තිබූ පර්යේෂණ 03 ක් ක්‍රියාත්මක නොකර අත්හිටුවා තිබුණි. | පර්යේෂණ ආයතනය විසින් ව්‍යාපෘතියේ සමස්ත වගකීම භාරගැනීමට නිලධාරියෙකු ආයතනයේ නොමැති බව දන්වා සිටීමත්, පර්යේෂණ ශිෂ්‍යයෙකු නොමැතිකමත් හේතුවෙන් ව්‍යාපෘතිය අවසන් කිරීමට ප්‍රධාන පර්යේෂක විසින් කල් ඉල්ලා සිටීමත්, මිලදී ගැනීම් සඳහා වෙන්කළ මුදල් වත්මන් වෙළෙඳපොළ මිල ඉක්මවීමත් හා ව්‍යාපෘතිය ආරම්භයේ සිටම කිසිදු වියදමක් සිදුකර නොතිබීමත් වැනි කරුණු හේතුවෙන් මෙම පර්යේෂණ 03 අත්හිටුවීමට සිදු වූ බව. | පර්යේෂණ සඳහා භාණ්ඩාගාර ප්‍රදාන ලබා ගැනීමේ දී නිසි පරිදි ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමෙන් පසු ව්‍යාපෘති ක්‍රියාත්මක කර පර්යේෂණ තුළින් රටට නිසි ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2022 වර්ෂයේ ආරම්භ කර 2023 වර්ෂයේ අවසන් කිරීමට නියමිත ව්‍යාපෘති 05 ක් සඳහා අමාත්‍යාංශයෙන් රු.12,256,290 ක් ලබා දී තිබුණු අතර, එම ව්‍යාපෘති සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.6,928,581 ක් පමණක් වැය කර තිබුණි. ව්‍යාපෘති සැලසුම් කල පරිදි අවසන් කර නොතිබුණු අතර, ලබා දුන් අරමුදල්වලින් රු.5,327,709ක් ඌන උපයෝජිතව පැවතුණි. | පර්යේෂණ නියමිත කාලය තුලම ඉටුකර අවසන් කිරීමට පර්යේෂකයින් මෙහෙයවීම සඳහා පවතින වැඩපිළිවලවල් වඩාත් ක්‍රමානුකුල කිරීමේ අවශ්‍යතාවය පිළිගන්නා බව. | පර්යේෂණ ව්‍යාපෘති සඳහා ලැබෙන මුදල් උපරිම ඵලදායීතාවයක් ලැබෙන පරිදි විධිමත් වැඩපිළිවෙලක් හරහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පාලන ක්‍රමවේද හඳුන්වා දිය යුතුය. |